සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

රාජකීය විද්‍යාලය - කොළඹ 07

Royal College - Colombo 07 Royal College

දෙවන වාර පරීක්ෂණය - 2024 සැප්තැම්බර්

12 ශ්‍රේණිය

ජීව විද්‍යාව I
Biology I

09 S I

පැය 1 මිනිත්තු 40

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

1. ජීවීන්ගේ ලාක්ෂණික ලක්ෂණ සම්බන්ධව පහත කුමන ප්‍රකාශය සත්‍ය වේද ?
   (1) ප්‍රතිවර්ත්‍ය ලෙස සිදුවන වියළි ස්කන්ධයේ වැඩිවීම වර්ධනයයි.
   (2) ප්‍රවේණික ද්‍රව්‍යවල සිදුවන විකරණවලට අනුකූලව කාලයත් සමඟ ජීවීන්ට වෙනස්වීමට ඇති හැකියාව ආවේණියයි.
   (3) ජීවියකුගේ ජීවිත කාලය තුළ දී සිදුවන සියලු අප්‍රතිවර්ත්‍ය වෙනස්වීම් විකසනය නම් වේ.
   (4) බාහිර හා අභ්‍යන්තර පරිසර වලින් පැමිණෙන උත්තේජ වලට ප්‍රතිචාර දැක්වීමේ හැකියාව සමස්ථිතියයි.
   (5) ජීවීන්ගේ සමායෝජනය යනු බාහිර පරිසරය වෙනස් වුවද අභ්‍යන්තර පරිසරය නියතව තබා ගැනීමයි.

2. *Agaricus* සෛල බිත්තියේ පවතින පොලිසැකරයිඩයේ තැනුම් ඒකකය වන්නේ,
   (1) ග්ලූකොසැමින්
   (2) ග්ලැක්ටියුරොනික් අම්ලය
   (3) පෙප්ටිඩොග්ලයිකැන්
   (4) ෆ්රක්ටෝස්
   (5) ග්ලූකෝස්

3. ප්‍රෝටීනවල උදාහරණ - කෘත්‍ය සම්බන්ධය නිවැරදිව දැක්වෙන්නේ,
   (1) කෙරටින් - වියළීම වලකයි.
   (2) මස්තු ඇල්බියුමින් - මේද අම්ල පරිවහනය
   (3) ඕවැල්බියුමින් - වියළීම වළක්වයි.
   (4) ඇක්ටින් - ශක්තිමත් බව හා සන්ධාරණය ලබාදීම.
   (5) හිමොග්ලොබින් - කිරිවල සංචිත ප්‍රෝටීනය වේ.

4. පහත දී ඇති ප්‍රකාශ අතුරින් රළ අන්තඃප්ලාස්මීය ජාලිකාවේ කෘත්‍යයන් වන්නේ

   A - තෙල්, ස්ටෙරොයිඩ සහ පොස්පොලිපිඩ සංශ්ලේෂණය
   B - ග්ලයිකොප්‍රෝටීන සංශ්ලේෂණය කිරීම.
   C - විෂහරණයට දායක වීම.
   D - පරිවහන ආශයිකා නිපදවීම

   මින් සත්‍ය වන්නේ,

   (1) A හා B පමණි. (2) B හා C පමණි. (3) B හා D පමණි.
   (4) C හා D පමණි. (5) A, C හා D පමණි.

5. මොනොසැකරයිඩ සම්බන්ධයෙන් සත්‍ය ප්‍රකාශය වන්නේ,
   (1) එරිත්‍රෝස් ස්වභාවයේ විරල ට්‍රයෝසයක් වේ.
   (2) පොස්පොග්ලිසරැල්ඩිහයිඩ ටෙට්‍රෝසවල ව්‍යුත්පන්නයකි.
   (3) කාබන් පරමාණු 1 සිට 7 දක්වා වෙනස්වීමෙන් මොනොසැකරයිඩ සෑදේ.
   (4) ගැලක්ටෝස් කීටෝස කාණ්ඩයට අයත් මොනොසැකයිඩයකි.
   (5) ජලීය මාධ්‍යයේදී ෆ්රක්ටෝස් වළලු ආකාරයෙන් පවතී.

6. ප්‍රාග්න්‍යෂ්ටික හා සුන්‍යෂ්ටික සෛල වලට පොදු ලක්ෂණයක් වන්නේ,

(1) වලයාකාර DNA පවතින අතර ඒවා හිස්ටෝන ප්‍රෝටීන හා සම්බන්ධ වී ඇත.

(2) පටල වලින් වට වී නැති ඉන්ද්‍රියිකා පවතින අතර ප්‍රවේණික ද්‍රව්‍ය ලෙස DNA පවතී.

(3) කශිකා පවතින අතර ඒවා 9 +2 ව්‍යුහය දරණ, විෂ්කම්භය 200 nm පමණ වන ව්‍යුහයන්ය.

(4) 70S රයිබසෝම පවතින අතර ඒවා අන්තඃප්ලාස්මීය ජාලිකා වලට සම්බන්ධ වී පැවතිය හැකිය.

(5) අවුරුදු බිලියන 3.5 කට පෙර සම්භවය වී ඇති අතර ඌනනය සහ අනූනනය යන විභාජන ආකාර පෙන්වයි.

7. ලිපිඩ සම්බන්ධයෙන් සත්‍ය වන්නේ,

(1) C, H, O වලින් සමන්විත විශාල බහුඅවයවික වේ.

(2) සංතෘප්ත මේදය හා cis මේදය වැඩිපුර භාවිතය නිසා ධමනි බිත්ති ඝනවීම්වලට ලක්වේ.

(3) සෛල පටලවල ප්‍රධාන සංඝටකයක් වන පොස්ෆොලිපිඩ අණුවේ ඇති ෆොස්ෆේට් කාණ්ඩය මගින් සෘණ ආරෝපණයක් ලබා දේ.

(4) පොස්ෆොලිපිඩ අණුවේ අන්ත දෙක එකම හැසිරීමක් පෙන්වන අතර එහි හයිඩ්‍රොකාබන් වලිග ජලභීතික වේ.

(5) මේද අම්ල වල C පරමාණු 3 ක් අඩංගු වන අතර එක් එක් කාබන්ට -OH කාණ්ඩ බැගින් සම්බන්ධ වී ඇත.

8. පහත ප්‍රකාශ සලකන්න.

(A) රයිබොසෝම උප ඒකක දෙකක් දරන අතර ඒවා සම්පූර්ණයෙන් rRNA මගින් තැනී ඇත.

(B) 80S රයිබොසෝම සුන්‍යෂ්ටිකයන් තුල පමණක් පවතින අතර ඇතැම් ඒවා රළු අන්තඃප්ලාස්මීය ජාලිකාවට සම්බන්ධය.

(C) ප්‍රෝටීන සංශ්ලේෂණය සඳහා අවශ්‍ය රයිබොසෝම උපඒකක න්‍යෂ්ටිකාව මගින් සංශ්ලේෂණය වේ.

ඉහත ප්‍රකාශ අතුරින් සත්‍ය වන්නේ,

(1) A පමණි.

(2) A , B පමණි.

(3) B, C පමණි.

(4) A හා C පමණි.

(5) A , B හා C සියල්ලමය

9. අසත්‍යය ප්‍රකාශය තෝරන්න.

(1) ප්‍රාථමික සෛල බිත්ති ලපටි සෛල වල පළමුව ස්‍රාවය වන නම්‍යශීලී, පාරගම්‍ය, තුනී ව්‍යුහයකි.

(2) පෙක්ටින් නැමති ඇලෙන සුළු පොලිසැකරයිඩ සහිත මධ්‍යසුස්තරය ප්‍රාථමික සෛල බිත්තියට ඇතුලතින් පවතී.

(3) ද්විතියික බිත්තිය තැන්පත් වන්නේ ප්ලාස්ම පටලය හා ප්‍රාථමික සෛල බිත්තිය අතරය.

(4) අන්තශ්චර්මයේ සෛලවල ද්විතියික බිත්තියේ සුබරීන් තැන්පත් වීමෙන් ඇපොප්ලාස්ට මාර්ගය අවහිර වේ.

(5) ද්විබීජ පත්‍රී ප්‍රාථමික කඳේ අසමාකාර සෙලියුලෝස් ඝණවීම සහිත ප්‍රාථමික බිත්ති දරණ ස්ථූලකෝණාස්තර රැහැන් පවතී.

- 10 , 11 ප්‍රශ්න පහත රූපය මත පදනම් වේ.




A



B

10. ඉහත දැක්වෙන A හා B විභාජන අවධි පිළිවෙලින්,
(1) ප්‍රාක්කලාව හා වියෝග කලාව
(2) ප්‍රාක්කලාව I හා වියෝග කලාව
(3) ප්‍රාක්කලාව I හා යෝග කලාව I
(4) ප්‍රාක්කලාව I හා යෝග කලාව II
(5) ප්‍රාක්කලාව II හා යෝග කලාව II

11. ඉහත A රූපය පිළිබඳ සත්‍ය වන්නේ,
(1) උපාශම පට සංකීර්ණය වෙන් වූ පසු අවතරණය සිදු වූ ලක්ෂ්‍ය y මංසල ලෙස පෙනේ.
(2) y ලෙස දක්වා ඇත්තේ සහෝදර නොවන වර්ණදේහාංග ලෙස පිහිටන උපාගමයයි.
(3) y ලෙස දක්වා ඇත්තේ සහෝදර වර්ණදේහ යුගලනයෙන් සෑදෙන උපාගම පට සංකීර්ණයයි.
(4) සමජාත වර්ණදේහ ප්‍රතිවිරුද්ධ ධ්‍රැවයන්ට සම්බන්ධ කිරීම ශාක සෛල වල x මගින් සිදුකරයි.
(5) z මගින් සහෝදර නොවන වර්ණදේහ දැක්වෙන අතර ඒවා යෝග කලා තලයට ගමන් කරයි.

- ජීව සෛල තුල හමුවන සංයෝග කිහිපයක් පහත දැක්වේ. 12 හා 13 ප්‍රශ්න වලට ඒ ඇසුරින් පිළිතුරු සපයන්න.

A) ඇසිටයිල් සහ එන්සයිම A
B) $FADH_2$
C) NADH
D) RuBP
E) 3 - PGA

12. ප්‍රභාශ්වසනයේ දී නිපදවන සංයෝගය / සංයෝග වන්නේ,
(1) A පමණි.
(2) B පමණි.
(3) C හා D පමණි.
(4) D හා E පමණි.
(5) E පමණි.

13. ග්ලයිකොලිසිය හා සිට්‍රික් අම්ල චක්‍රය සම්බන්ධ කරන ප්‍රතික්‍රියාවේ දී නිපදවෙන ඵලයක් / ඵල වන්නේ,
(1) A පමණි.
(2) A හා B පමණි.
(3) A හා C පමණි.
(4) B පමණි.
(5) B හා C පමණි.

14. ක්ෂුද්‍රපෘෂ්ඨිකයන්ගේ විවිධාංගීකරණය සම්බන්ධයෙන් පහත සඳහන් කුමක් නිවැරදි වේද ?
(1) පොසිල සාක්ෂි වලට අනුව ස්පොන්ජීන් පරිණාමය වී ඇත්ත් වසර මිලියන 700 කට පෙරදීය.
(2) ශාක හා දිලීර භෞමික සත්‍වාවාසීකරණය වෙන් වෙන්ව සිදුවිය.
(3) පොරිෆෙරා, ස්පොන්ජීන්, නිඩාරියා සහ මොලස්කාවන් බිහිවන්නේ මුල් ප්‍රෝටෙරොසොයික් අවධියේදිය.
(4) සතුන් පාරිභෝගිකයන් ලෙස ඇල්ගී හෝ ශාක මත යැපීම ආරම්භයෙත් සමග මුල්ම ආහාර දාමය ආරම්භ විය.
(5) මුල්ම සිවුපාවා පරිණාමය වී ඇත්තේ කණ්ඩික මත්ස්‍යයන්ගෙනි.

15. ආකියා අධිරාජධානිය, යුකැරියා අධිරාජධානියෙන් වෙනස් වන ප්‍රධාන වෙනස්කමක් වන්නේ,

(1) ලෛසල පටල වල හයිඩ්‍රොකාබන ශාඛනය වී තිබීම.

(2) ජානවල ඉන්ට්‍රෝන නොතිබීම.

(3) Streptomycin ප්‍රතිජීවකය සඳහා සංවේදීතාවය.

(4) ප්‍රෝටීන සංස්ලේෂණය සඳහා ආරම්භක ඇමයිනෝ අම්ලය වෙනස් වීම.

(5) RNA පොලිමරේස එක් ආකාරයක් පමණක් පැවතීම.

16. දැනට පවතින බීජශාකවලට වඩාත්ම සමීපතම පූර්වජයා වන්නේ,

(1) අක්මාශාක (2) පාසි (3) අංශාක

(4) ලයිකොෆයිටාවන් (5) මොනිලොෆයිටාවන්

17. බ්‍රයොෆයිටාවන්ට පොදු ලක්ෂණයක් වන්නේ,

(1) සන්නායක පටක නොපැවතිම.

(2) පත්‍ර, කඳ හා මූලාග පැවතීම

(3) චල ජන්මාණු

(4) ස්වාධීන බීජාණුශාකය

(5) ද්විලිංගික ජන්මාණුශාකය

18. බිජශාක සම්බන්ධයෙන් නිවැරදි වන්නේ,

(1) සියලුම බීජශාක වල ජන්මාණු ශාක අන්වීක්ෂීය වේ.

(2) බීජාණුශාකවල තෙත් ප්‍රජනක පටක මඟින් ජන්මාණුශාක වියළීම වලක්වයි.

(3) බිජවල කලලය හා භ්‍රෑණපෝෂය පමණක් අන්තර්ගත වේ.

(4) මහාබීජාණුධානිය හා ඩිම්බාවරණ අන්තර්ගත ව්‍යුහය ඩිම්බය නම වේ.

(5) ජායා ජන්මාණුශාකය මහාබීජාණුවෙන් විකසනය වන අතර එක් අණ්ඩයක් නිපදවයි.

19. දිලීර ලිංගික ප්‍රජනන සම්බන්ධයෙන් පහත සඳහන් කුමක් නිවැරදි වේද ?

(1) *Aspergillus* බහිර්ජන්‍ය ලෙස කොනිඩියා නිපදවයි.

(2) *Saccharomyces* අස්කස නොනිපදවයි.

(3) රාක්ක හතු බැසිඩිඵල වල තැලි තුල බැසිඩියම නිපදවයි.

(4) *Agaricus* බැසිඩිඵල නිපදවයි.

(5) *Mucor* ලිංගිකව විභේදිත ජන්මාණුධානී නිපදවයි.

20. නිවැරදි සම්බන්ධතාවය තෝරන්න.

(1) නිඩාරියාවන් - ලිංගික ප්‍රජනනය පමණක් දැකිය හැක.

(2) පැතලි පනුවන් - සංකීර්ණ ස්නායු පද්ධතියක් දැකිය හැක.

(3) නෙමටෝඩාවන් - සියල්ලන් ම මහේක්ෂීය වේ.

(4) ඇනලිඩාවන් - පෘෂ්ඨීය මස්තිෂ්ක ගැංග්ලියා ඇත.

(5) මොලස්කාවන් - සියල්ලන් ම රේත්‍රිකාව දරයි.

21. එකයිනොඩර්මේටාවන්ට අනන්‍ය වූ ලක්ෂණයක් වන්නේ,

(1) කුටීර දෙකකින් යුත් හෘදයක් සහිත සංවෘත රුධිර සංසරණ පද්ධතිය

(2) බහිස්‍රාවය පිටිකා හරහා සිදුවීම.

(3) ශාඛනය වූ නාළ පද්ධතියක් සහිත ජලවාහිනි පද්ධතිය

(4) අන්වායාම ස්නායු හා ස්නායු වලය

(5) බන්ධනය

22. ශාක පටක පද්ධති පිළිබඳ නිවැරදි ප්‍රකාශය තෝරන්න.

(1) උපල සෛල කඩු ලෙස පවතින බීජාවරණවල, ඵලාවරණවල හා ඇතැම් ඵලවල මාංසලයේ පවතී.

(2) මෘදුස්තර හා ස්ථූලකෝණාස්තර සෛල වර්ග දෙකෙහිම විශාල මධ්‍ය රික්තක පවතී.

(3) වාහිනී ඒකකවලට වඩා වාහකාංගවල බිත්ති තුනී වේ.

(4) පරිණත පෙනේර නළ ඒකක අතර ඇති හරස් බිත්ති සිදු වැටී ඇත.

(5) Anthophyta හා Cycadophyta වල ශෛලම පටකයේ සෛල ආකාර හතරක් ද , ප්ලෝයම පටකයේ සෛල ආකාර හතරක් ද බැගින් පවතී.

23. ශාකවල ව්‍යුහය ,වර්ධනය හා විකසනය පිළිබඳව නිවැරදි ප්‍රකාශය තෝරන්න.

(1) ද්විතීයික වර්ධනයේ පසු අවධියේ පවතින වූ ද්විබීජපත්‍රි ශාක කඳක අපිචර්මය නොමැත.

(2) ප්‍රාථමික වර්ධනය පමණක් සිදු වූ ශාක මූලක අපිචර්මය, උච්චර්මය නම් වැස්මෙන් ආවරණය වී ඇත.

(3) සියලුම අවෘත බීජ ශාක කඳන් වල සනාල කලාප තුළ කැම්බියම පිහිටයි.

(4) විවෘත බීජ ශාකවල ද්විතියික වර්ධනය සිදු නොවේ.

(5) ඒකබීජපත්‍රි හා ද්විබීජපත්‍රි ශාක මුල්වල පරිචක්‍රය කෘත්‍යමව සමාන වේ.

24. ශාක පත්‍ර පිළිබඳව සත්‍ය ප්‍රකාශය තෝරන්න.

(1) ද්විබීජ පත්‍රි ශාක පත්‍රවල ඉනි මෘදුස්තර පටකය, සෛල ස්තර එකකින් පමණක් සමන්විතය.

(2) ද්විබීජ පත්‍රි ශාක පත්‍රවල හරිතලව ඇත්තේ ඉනිමං ස්තර හා සවිවර මෘදුස්තර සෛලවල පමණි.

(3) ද්විබීජපත්‍රි ශාක පත්‍රයේ සනාල පටක, කඳේ සනාල පටක සමග අඛණ්ඩව බැඳී ඇත.

(4) කුඩාමූ පත්‍ර ඇත්තේ ඉතා වියළි පරිසරවල වැවෙන ශාක වලට පමණි.

(5) තෘණ පත්‍රවල සිරස් පැතසීම කාර්යක්ෂම ආලෝක ග්‍රහණයට ඉවහල් වේ.

25. නිවැරදි ප්‍රකාශය තෝරන්න.

(1) සමහර තත්ත්ව යටතේ සංශුද්ධ ජලයේ ජල විභවය 0 ට ඉහළ අගයක් ගනියි.

(2) ආසෘතියේ දිශාව කෙරෙහි ද්‍රාව්‍ය බලපායි.

(3) ශෛලම වාහිනී වල $\psi_p$ සාමාන්‍යයෙන් ධන අගයක් ගනී

(4) විශුෂ්ක සෛලයක් එම සෛලයට වඩා වැඩි ද්‍රාව්‍ය සාන්ද්‍රණයක් ඇති ද්‍රාවණයක ගිල් වූ විට, ප්‍රාක්ප්ලාස්ටය ප්ලාස්ම පටලය සෛල බිත්තිය මතට තෙරපවයි.

(5) සෛලයක් පූර්ණ ශූන වූ විට $\psi = \psi_s$ වේ.

26. සංසක්ති ආතති කල්පිතයට අනුව,

(1) ශෛලමය තුළින් ජලය ඉහළට ගමන් කිරීමට ධන පීඩන විභවය උදවු වේ.

(2) රසෝද්ගමනය සඳහා චූෂණය මූල පීඩනය මඟින් සපයයි.

(3) සංසක්තිය හේතුවෙන් ජල අණු ශෛලම බිත්ති තුළ සෙලියුලෝස් අණුවලට ආකර්ෂණය වේ.

(4) සමහර ශාකවල ශෛලම යුෂ ඉහළ නැගීමට ශාකයේ ශක්තිය වැය කෙරේ.

(5) ආතති බලය, ශෛලමයේ වූ ජල කුලින් සම්ප්‍රේෂණය කරවන්නේ ජල අණුවල සංසක්තියයි.

27. ප්ලෝයම පරිසංක්‍රමණයේ යාන්ත්‍රණය සම්බන්ධයෙන් නිවැරදි වගන්තිය තෝරන්න.

(1) බොහෝ ශාක විශේෂවල පත්‍ර මධ්‍ය සෛලවල සිට පෙනේර නල තුළට සිම්ප්ලාස්ටය ඔස්සේ සීනි ඇතුල් වේ.

(2) පත්‍ර මධ්‍ය සෛලවල සීනි වඩා වැඩි සාන්ද්‍රණයකින් පවතින නිසා බොහෝ ශාකවල ප්ලෝයම බැර කිරීම සක්‍රියව සිදුවේ.

(3) ශාකවල ප්ලෝයම පරිසංක්‍රමණය ආකන්ධවල සිට අංකුර දක්වා සිදුවිය හැක.

(4) ප්ලෝයම බැරවීම හා හරවීම තොග ප්‍රවාහයක් ලෙස ධන පීඩනයක් යටතේ සිදුවේ.

(5) ප්ලෝයම හරවීම නිසා ආපායනය අසල පෙනේර නළය තුළ ජලවිභවය අඩුවේ.

28. උත්ස්වේදන ශීඝ්‍රතාවයට වැඩිම බලපෑමක් ඇති කරන බාහිර සාධකය වන්නේ,

(1) උෂ්ණත්වය (2) ආර්ද්‍රතාවය (3) පාංශු ජල සැපයුම
(4) ආලෝක තීව්‍රතාව (5) සුළඟේ වේගය

29. පහත සඳහන් කුමන ලක්ෂණය සියලුම භෞමික ශාකවලට පොදු ද?

(1) සංසේචනයට ජලය අවශ්‍ය වීම. (2) විෂමරූපී පරම්පරා ප්‍රත්‍යාවර්තනය
(3) ක්ෂිණ වූ ජන්මාණු ශාකය (4) අණ්ඩධානී හා ශුක්‍රාණුධානී පැවතීම.
(5) කශිකාධර ශුකාණු

30. ශාකවල ලක්ෂණ කිහිපයක් පහත දී ඇත.

A - බීජාණුධානි වර්ග දෙකක් තිබීම
B - ස්වාධීන ජන්මාණු ශාකය
C - විෂම පත්‍රී වීම
D - ප්‍රභාසංශ්ලේෂක ජන්මාණු ශාකය
E - පුටිකා පැවතීම

පහත දී ඇති ශාක අතුරින් ඉහත සඳහන් ලක්ෂණ වැඩි ප්‍රමාණයක් පෙන්වන්නේ කුමන ශාකයද ?

(1) *Cycas* (2) *Pogonatum* (3) *Nephrolepis*
(4) *Cocos nucifera* (5) *Selaginella*

31. අභ්‍යන්තර හා බාහිර උත්තේජවලට ශාක දක්වන ප්‍රතිචාර කිහිපයක් පහත දැක්වේ.

A - ප්‍රරෝහ දික්වීම
B - වියනට යටින් ඇති ශාක උසින් වර්ධනය වීම
C - පුෂ්ප හට ගැනීම
D - බීජ පැළය පස මතු පිටට පැමිණි පසුව බීජාධරය දික්වීම නිශේධනය
E - බීජ ප්‍රරෝහණය නිශේධනය

ධූරරක්ත කිරණ මඟින් පාලනය කරනු ලබන ප්‍රතිචාර මොනවාද ?

(1) A සහ B (2) A, B සහ D (3) A, D සහ E
(4) B, C සහ E (5) C, D සහ E

32. ශාක හෝමෝනය සහ එහි කෘත්‍යය සම්බන්ධයෙන් නිවැරදි යුගලය තෝරන්න.

(1) සයිටොකයිනින - පත්‍ර වෘද්ධතාව දිරි ගන්වයි.
(2) ගිබරලින - ඵල විකසනය යාමනය කරයි.
(3) එතිලින් - කඳ දික්වීම නිශේධනය කරයි.
(4) ඔක්සින - සනාල පටක විභේදනය යාමනය කරයි.
(5) ඇබ්සිසික් අම්ලය - පත්‍ර ඡේදනය දිරි ගන්වයි.

- ප්‍රශ්න අංක 33 – 40 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට අවශ්‍ය උපදෙස් පහත වගුවේ සැකෙවින් දක්වා ඇත.

| 1 | 2 | 3 | 4 | 5 |
|---|---|---|---|---|
| A, B, D ප්‍රතිචාර නිවැරදිය | A, C, D නිවැරදිය | A, B නිවැරදිය | C, D නිවැරදිය | වෙනත් ප්‍රතිචාර එකක් හෝ කිහිපයක් නිවැරදිය |

33. RNA සම්බන්ධව සත්‍ය ප්‍රකාශය / ප්‍රකාශ වන්නේ,

(A) සාපේක්ෂව සෛල තුළ අඩුවෙන් පවතින RNA වර්ගය mRNA වේ.
(B) සාපේක්ෂව සෛල තුළ බහුලතම RNA වර්ගය rRNA වේ.
(C) mRNA අණුව ප්‍රතිකොඩෝන දරයි.
(D) අනුපූරක භෂ්ම යුගලනය වීම නිසා RNA වල කෘත්‍යයට අවශ්‍ය ත්‍රිමාණ ව්‍යුහය පවත්වා ගනී.
(E) RNA සාමාන්‍යයෙන් තනි පට නියුක්ලෙයික් අම්ලයකි.

34. ග්ලයිකොලිසිය පිළිබඳ නිවැරදි ප්‍රකාශය / ප්‍රකාශ වන්නේ,

(A) ATP භාවිතා වන ක්‍රියාවකි.

(B) සෛටසොලය තුළ පමණක් සිදුවේ.

(C) අතරමැදි ඵලයක් ලෙස $CO_2$ මුක්ත වේ.

(D) නිදහස් වන ශක්තියෙන් ATP නිපද වේ.

(E) NADPH නිපදවේ.

35. ට්‍රිප්සින් පිළිබඳ සත්‍ය ප්‍රකාශය / ප්‍රකාශ වන්නේ,

(A) ද්විතියික ප්‍රෝටීනයකි.

(B) උෂ්ණත්වය සඳහා සංවේදී නොවේ.

(C) ප්‍රෝටීන ජීර්ණය සඳහා දායක වේ.

(D) ප්‍රශස්ථ pH පරාසය pH 6 - 10 පමණ වේ.

(E) ජීවී සෛල තුළ පමණක් ක්‍රියාකරයි.

36. සතුන්ගේ දේහ ආවරණය පිළිබඳ පහත සඳහන් කුමක් සත්‍යවේද ?

(A) මැඩියා - තුනී, තෙත, ග්‍රන්ථිමය

(B) කැස්බෑවා - ග්‍රන්ථි රහිත, කෙරටීනිමය කොරළ

(C) මඩුවා - රළු හා චක්‍රාකාර කොරළ වලින් දේහය ආවරණය වීම

(D) ගවයා - රෝම, කෙරටිනිභවනය වූ කොරළ, ග්‍රන්ථි රහිත සම.

(E) මුහුදු කැකිරි - කැල්සිනීභවනය වූ ඵලක සහිත තුනී අපිචර්මය

37. අන්තඃසැකිල්ලක් හා බාහිර සැකිල්ලක් දරණ සත්ත්ව කාණ්ඩය / කාණ්ඩ

(A) රෙප්ටිලියාවන්

(B) එකයිනොඩර්මේටාවන්

(C) ආත්‍රපෝඩාවන්

(D) මොලස්කාවන්

(E) පක්ෂීන්

38. පූටිකා හා එහි ක්‍රියාකාරීත්වය පිළිබඳ සත්‍ය වනුයේ,

(A) පාලක සෛල වටා සෙලියුලෝස් ක්ෂුද්‍ර නාලිකා අරීය ආකාරයට සැකසී අප්‍රත්‍යස්ථ වළලු සාදයි.

(B) පූටිකා මගින් සිදුවනුයේ වායු හුවමාරුව පමණි.

(C) ඇබ්සිසික් අම්ලය මගින් පාලක සෛලවල $K^+$ ඉවත් කරයි.

(D) අධඃපූටිකා කුටීරය තුල $CO_2$ සාන්ද්‍රණය අඩුවීම නිසා පූටිකා විවෘත වෙයි.

(E) පූටිකා වල අභ්‍යන්තර ඝටිකාව එහි දෛනික රිද්මය පාලනය කරයි.

39. ශෛලම වාහිනී තුළ අඛණ්ඩව ජල කඳක් පවත්වා ගැනීමට වැදගත් වන්නේ,

(A) ජල අණුවල සංසක්තිය

(B) උත්ස්වේදනය

(C) ජලයේ හයිඩ්‍රජන් බන්ධන

(D) ජල අණුවල ආසක්තිය

(E) මූල පීඩනය

40. ඇනායන ලෙස ශාක විසින් ලබාගනු ලබන මූලද්‍රව්‍යය / මූලද්‍රව්‍ය වන්නේ,

(A) N

(B) Ni

(C) Mo

(D) P

(E) O



CamScanner